# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2009 අංක 62 දරන මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 30 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 ඔක්තෝබර් මස 30 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2009 අංක 62 දරන මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2009 ඔක්තෝබර් මස 30 වන දින]

එල්.ඩී.—ඕ. (අයි.එන්.සී.) 15/2007

### මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සමිතියක් එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, සමිතියට සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්ය සඳහා මෙතෙක් කල් මහනුවර පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, එකී පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ගෙන ගොස් ඇති හෙයින් සහ එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2009 අංක 62 දරන මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මක වන දින සිට හා ඉන්පසුව (මෙහි මින්මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතියේ දැනට සාමාජිකයන් වී සිටින තැනැත්තන් හා මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, සංස්ථාව විසින් හා එයට විරුද්ධව ද එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අයිතිය ඒ සංස්ථාවට ඇත්තේ ය. මහනුවර ශ්‍රී කල්‍යාණෝදය සමිතිය සංස්ථාගත කිරීම.

PL 002112—2,650 (2009/07)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) බෞද්ධයන් අතර බුද්ධ ශාසනයේ පෝෂණය, ව්‍යාප්තිය හා චිරස්ථිතිය සඳහා පියවර ගැනීම ;

(ආ) බෞද්ධයන් අතර සමගිය, ප්‍රගමනය සහ සහයෝගය වැඩිදියුණු කිරීම සඳහා සියලු බෞද්ධ සමිති සමග සහයෝගයෙන් කටයුතු කිරීම ;

(ඇ) බෞද්ධයන් අතර බෞද්ධ මූලධර්ම ප්‍රගුණ කිරීම සඳහා දහම් පාසල් වල ධර්ම දේශනා පැවැත්වීම හා භාවනා මූලධර්ම ව්‍යාප්ත කිරීම ;

(ඈ) බෞද්ධයන් සඳහා සුභසාධන වැඩපිළිවෙලක් ඇති කිරීම ;

(ඉ) බෞද්ධයන්ගේ යහපත සඳහා සංස්ථාව සතු ගොඩනැගිලි හා දේපළ නඩත්තු කිරීම සහ පාලනය කිරීම ;

(ඊ) බෞද්ධයන් සඳහා බෞද්ධ අධ්‍යාපනික හා සංස්කෘතික කටයුතුවල නියැලීම ; සහ

(උ) බෞද්ධයන් සඳහා ආගමික හා අධ්‍යාපනික චාරිකා සංවිධානය කිරීම.

සංස්ථාවේ උපදේශක මණ්ඩලය.

4. කළමනාකරණ කමිටුවට උපදෙස් යෝජනා කිරීම සඳහා ගිහි සහ පැවිදි පක්ෂය ඇතුළු සාමාජිකයන් හත්දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු සංස්ථාවේ උපදේශක මණ්ඩලයක් තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) මේ පනතේ විධිවිධානවලට සහ 8 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව සංස්ථාවේ කළමනාකරණය සහ පරිපාලනය, සභාපතිවරයා, උප සභාපතිවරුන් හතර දෙනෙකු, ප්‍රධාන ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, විගණක නිලධාරී, සංවිධායක සහ තවත් සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත කළමනාකරණ කමිටුවක් වෙත පැවරිය යුතු ය.

(2) සුභසාධනය සඳහා සංස්ථාවට උප කමිටුවක් තිබිය යුතු අතර, සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී විශේෂ උප කමිටු පිහිටුවනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීමේ දිනයට පෙරාතුව වූ දිනයේ දී සමිතියේ ධුර දරන ලද කළමනාකරණ කමිටුවේ ධුර දරන ලද තැනැත්තන් සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ කමිටුවේ සාමාජිකයන් විය යුතු ය.

සාමාජික නාම ලේඛනය.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ සාමාජිකයන් වූ සෑම තැනැත්තකු විසින් සහ ඉන් පසුව සංස්ථාවේ සාමාජිකයකු වශයෙන් යථා පරිදි ඇතුළත් කරගනු ලබන සෑම තැනැත්තකු විසින් ස්වකීය නාමය සටහන් කරවා ගතයුතු නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

සංස්ථාවේ බලතල.

**7.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සංස්ථාවට අයත් ඉඩම් හෝ ගොඩනැගිලි කුලියට දීම ;

(ආ) අරමුදල් ගොඩනැගීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදානයන්, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම ;

(ඇ) සංස්ථාවට අයිති කවර හෝ ඉඩමක ඕනෑම ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ඉදිකරවීම ;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ ගණුදෙනු කළ හැකි වෙනත් සාධන පත්‍ර සෑදීම, ලිවීම, භාරගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම හා ඕනෑම බැංකුවක ජංගම, ඉතිරිකිරීමේ සහ තැන්පතු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් කළමනාකරණ කමිටුව තීරණය කරනු ලැබිය හැකි ආකාරයට ආයෝජනය කිරීම ;

(ඊ) ඕනෑම චංචල හෝ නිශ්චල දේපළකට අදාළ යම් නෛතික භාරයක් සහ කොන්දේසි භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පාලනය කිරීම ;

(උ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, ඔවුනට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් සේවයේ යෙදවීම සහ සේවයෙන් පහකිරීම ; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා අවශ්‍යවන්නා වූ තැනැත්තන් පුහුණු කිරීම.

සංස්ථාවේ රීති.

8. (1) සංස්ථාව විසින් පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජියන්ගෙන් 2/3 කට නොඅඩු බහුතර ඡන්ද සංඛ්‍යාවකින් කලින් කල සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, සාමාජිකත්වය වර්ග කිරීම, ඉල්ලා අස්වීම හෝ නෙරපීම ;

(ආ) කාරක සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම, කාරක සභාවේ සාමාජිකයන්ගේ බලතල, කාර්යය සහ විනය පාලනය ;

(ඇ) ධුර දරන්නන් තෝරා පත් කිරීම, ඔවුන්ගේ ධුර කාලය, ඉල්ලා අස්වීම, ධුරය හැරයාම හෝ ඉවත් කිරීම, ඔවුන්ගේ බලතල, කාර්ය සහ විනය පාලනය ;

(ඈ) රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, ගණපූරණය සහ රැස්වීම් කටයුතු මෙහෙයවීම ;

(ඉ) සංස්ථාවේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් තීරණය කිරීම ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලබන රීති (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, දායක මුදල්, සම්මාදම් මුදල්, ගාස්තු හෝ ප්‍රදානයන් වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන බැංකු එකක හෝ වැඩි ගණනක තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හෝ සංවර්ධනය කිරීම සඳහා ඕනෑම ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් පිහිටුවීමට සංස්ථාවට හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් එකී අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අරමුදල සඳහා ලැබෙන සියලු මුදල් සහ දේපළ සංස්ථාවේ අරමුණු උදෙසා පමණක් යොදා ගනු ලැබිය යුතු අතර, කවර හෝ අවස්ථාවක ඒවා සාමාජිකයන්ට ලබා නොදිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාව විසින් එහි ආදායම, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යා යුතු ය.

(2) සංස්ථාවේ ගිණුම් අවම වශයෙන් සෑම වසරකට වරක්වත් සංස්ථාව විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් විගණනය කිරීම කළ යුතු ය.

(3) මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එම ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

සංස්ථාව විසින් ගෙවිය යුතු සහ සංස්ථාවට අය විය යුතු ණය.

11. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට ඉහතින් ම වූ දිනයේ දී සමිතියේ පැවැති සියලුම ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් හෝ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ දැරිය හැකි බව.

12. යම් මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, පරිත්‍යාගයකින්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට සංස්ථාවට නීතියෙන් බලය සහ හැකියාව ඇති අතර, එකී සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දැරිය යුතු ය. තව ද, 8 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීතිවලට යටත්ව එකී දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ද සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව.

13. කාරක සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් සාමාජිකයන් හෝ ධුර දරන්නන් ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් විසින් තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කරනු ලැබිය යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන අත්සනට පරිබාහිරව විය යුතු ය :

එසේ වුව ද, මූල්‍ය කටයුතුවලට අදාළ යම් සාධන පත්‍රයක් සභාපතිවරයා හෝ ලේකම්වරයා ද ඇතුළුව භාණ්ඩාගාරික හෝ සහකාර භාණ්ඩාගාරික විසින් අත්සන් කරනු ලැබ නොමැති නම් වලංගු නොවන්නේ ය.

**14.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත්, එම දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනවලට එම දේපළ දීම හෝ පැවරීම ක රනු ලැබිය යුතු ය. සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ ඊට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් එම ආයතනය හෝ ආයතන තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාව විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**15.** ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් ඇති නොවිය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**16.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.